**සත්වෝද්‍යාන සංවර්ධන හා සුභසාධක අරමුදල - 2013**

-----------------------------------------------------------

සත්වෝද්‍යාන සංවර්ධන හා සුභසාධක අරමුදලේ 2013 දෙසැම්බර් 31 දිනට ශේෂපත්‍රය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් හා වියදම් ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1982 අංක 41 දරන ජාතික සත්වෝද්‍යාන පනතේ 08 (5) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යාවස්ථාවේ 154 (3) ව්‍යාවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. යථෝක්ත මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

-----------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

---------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරීවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අරමුදලේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් අරමුදලේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගැයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගැයීමද විගණනයට ඇතුළත් වේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

---------------------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 02 මූල්‍ය ප්‍රකාශන

### 2.1 තත්ත්වාගණය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් ඇතිවන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2013 දෙසැම්බර් 31 දිනට සත්වෝද්‍යාන සංවර්ධන හා සුභසාධක අරමුදලේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 2.2.1 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය අවසානයට ප්‍රවේශ පත්‍ර කවුළුවේ ඉතිරිව තිබූ රු. 86,530 ක් පිරිවැය වූ ප්‍රවේශ පත්‍ර තොගයට ඇතුළත් කර නොතිබුණි.

(ආ) ආපනශාලා බදු දීමේදී ලබාගෙන තිබූ රු. 1,208,000 ක තැන්පත් මුදල් අරමුදලේ ජංගම බැරකම් යටතේ දැක්වීම වෙනුවට සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුවේ පොදු තැන්පත් ගිණුමේ ඇතුළත් කර තිබුණි.

(ඇ) ප්‍රතිපූර්ණය කර ගන්නා වියදම් සඳහා එකතු කළ අගය මත බදු මුදල් ගෙවීම අවශ්‍ය නොවූවද, ආපනාශාලාව බදුදීමේදී බදුකරුවන් තිදෙනෙකුගෙන් ප්‍රතිපූරණය කර ගන්නා ලද රු. 313,805 ක් වූ විදුලිය වියදම් ආදායම් සේ සලකා එකතු කළ අගය මත බදු ගෙවා තිබුණු බව නිරීක්ෂණය විය.

(ඈ) වත්කමේ අපේක්ෂිත ජීවිත කාලය ඉක්මවූ සම්පූර්ණයෙන් ක්ෂය කර තිබූ පිරිවැය රු. 47,081,891 ක් වූ වත්කම් වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේදී ද රු. 2,354,094 ක් ක්ෂය කිරීම හේතුවෙන් ක්ෂය ප්‍රතිපාදන හා ක්ෂයවීම එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින ප්‍රවේශපත් විකිණීමෙන් ලැබී තිබුණු රු.2,787,045 ක් සමාලෝචිත වර්ෂයේ ආදායම් ලෙස ගිණුම්ගත කර නොතිබුණි.

#### 2.2.2 පැහැදිලි නොකළ වෙනස්කම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ අවසානයට භාණ්ඩාගාර තැන්පත් ගිණුමේ ශේෂය රු. 1,318,581,680 ක් වූ අතර, මහා භාණ්ඩාගාර පරිගණක මුද්‍රිත සටහන් අනුව එය රු. 1,319,172,030 ක් විය. මේ අතර වෙනස වූ රු.590,350 සැසඳුම්කර හඳුනාගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ සත්ව හුවමාරු වියදම රු. 6,871,929 ක් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණද, අරමුදල විසින් නඩත්තු කර තිබූ ලේඛන අනුව එම වියදම රු. 6,748,445 ක් වූයෙන්, රු. 123,484 ක වෙනසක් නිරීක්ෂණය විය.

(ඇ) සමාලෝචිත වර්ෂයේ විස්තරාත්මක උපලේඛන අනුව ප්‍රවේශ පත්‍ර ආදායම සහ ගිණුම්ගත කර තිබුණු ප්‍රවේශ පත්‍ර ආදායම අතර රු.2,538,670 ක වෙනසක් නිරීක්ෂණය විය. ගිණුම්ගත නොවූ ආදායම් ලෙස රු.2,787,045 ක් ගැළපීමෙන් පසුව තවදුරටත් රු.248,375 ක වෙනසක් පැවතුණි.

### 2.2.3 විගණනය සඳහා සාක්ෂි නොවීම

පහත සඳහන් විෂයයන් ඉදිරියෙන් දක්වා ඇති සාක්ෂි විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

| | විෂයය | වටිනාකම<br>රු. | ඉදිරිපත් නොවූ සාක්ෂි |
|---|---|---|---|
| (අ) | නොනිමි වැඩ (වාගොල්ල නව සත්වෝද්‍යානය, සෆාරි උද්‍යානය හා දෙහිවල සත්වෝද්‍යානයේ ඉදිකිරීම්වලට අදාල) | 756,763,930 | වැඩ නිමකර ඇති ඉදිකිරීම්වල පිරිවැය වෙන් වෙන්ව දැක්වෙන උපලේඛන |
| (ආ) | පූර්ව වර්ෂ ගැලපීම් (2012 සහ 2013 වර්ෂවලට අදාල) | 8,490,000 | ජ'නල් සටහන් |
| (ඇ) | සමරු භාණ්ඩ තොග | 3,049,123 | පාඩු හානි ලේඛන, මුදල් රෙගුලාසි 104 වාර්තා, පොත්වලින් ලියාහැරීම සඳහා වූ භාණ්ඩාගාර අනුමැතිය |
| (ඈ) | සමරු පොත් | 2,032,544 | 2012 වර්ෂයේදී බෙදා හැර තිබුණු පොත් පිළිබඳ විස්තරාත්මක උපලේඛන හා බෙදාහැරීමේ උපලේඛන |
| (ඉ) | තැන්පතු ගිණුම | 935,700 | ලියාහැරීම සඳහා අනුමැතිය, සහ විස්තරාත්මක උපලේඛන |
| (ඊ) | ණයහිමියන් | 340,982 | විස්තරාත්මක උපලේඛන හා කාලවිශ්ලේෂණ |

## 2.3 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය පරිදි ස්ථාවර වත්කම් ලේඛනයක් විධිමත්ව පවත්වා නොතිබුණි.

**03.** **මූල්‍ය සමාලෝචනය**

**3.1** **මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂය සඳහා අරමුදලේ මෙහෙයුම් කටයුතුවල මූල්‍ය ප්‍රතිඵලය රු. 415,114,492 ක අතිරික්තයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂය සඳහා වූ අතිරික්තය රු.397,537,423 ක් වූයෙන් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 17,577,069 ක වර්ධනයක් දක්නට ලැබුණි.

**3.2** **විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ඉකුත් වර්ෂයට සාපේක්ෂව අරමුදලේ සමස්ථ ආදායම රු. 62,789,692 ක වැඩිවීමක් දක්නට ලැබුණු අතර, අරමුදලේ වියදම රු. 45,212,622 කින් වැඩිවී තිබුණි. තවද, සමස්ථ ප්‍රවේශ පත්‍ර ආදායම පසුගිය වර්ෂයේ ආදායමට සාපේක්ෂව රු.66,793,720 කින් වැඩිවී තිබුණු අතර, එයින් රු.55,950,950 ක් පින්නවල අලි අනාථාගාරයේ ප්‍රවේශ පත්‍ර ආදායම් වැඩිවීම් බව නිරීක්ෂණය විය.

(ආ) පසුගිය වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ දිරිදීමනා සහ හදිසි අනතුරු දීමනා ගෙවීම් රු.13,198,814 කින් වැඩිවී තිබූ අතර, 2013 ජනවාරි 01 දි සිට මාසික හදිසි අනතුරු දීමනාව රු. 2,500 දක්වා රු. 2,100 කින් වැඩි කිරීම ඒ සඳහා හේතුවී තිබුණි. මෙම හදිසි අනතුරු දීමනාව සඳහා පැමිණීම පදනම් කරගත් ගණනය කිරීමේ ක්‍රමවේදයක් හඳුන්වාදී තිබුණද, එය නිසියාකාරයෙන් ක්‍රියාත්මක කර නොතිබුණි.

**04.** **මෙහෙයුම් සමාලෝචනය**

**4.1** **කාර්යසාධනය**

**4.1.1** **නරඹන්නන්ගේ පැමිණීම සහ ආදායම**

සමාලෝචිත වර්ෂයේ සහ ඉකුත් වර්ෂයෙහි දෙහිවල සත්වෝද්‍යානය සහ පින්නවල අලි අනාථාගාරය නැරඹීම සඳහා පැමිණි නරඹන්නන් සංඛ්‍යාව සහ එමගින් ලද ආදායම් පිළිබඳ විස්තර පහත දැක්වේ.

(අ) දෙහිවල සත්වෝද්‍යානය

| | 2013 | | 2012 | |
|---|---|---|---|---|
| | පැමිණි නරඹන්නන් සංඛ්‍යාව | නරඹන්නන්ගෙන් ලද ආදායම | පැමිණි නරඹන්නන් සංඛ්‍යාව | නරඹන්නන්ගෙන් ලද ආදායම |
| | | රු. | | රු. |
| දේශීය | 1,429,322 | 112,079,300 | 1,412,062 | 110,039,210 |
| විදේශීය | 27,120 | 34,521,500 | 21,188 | 25,108,000 |
| එකතුව | 1,456,442 | 146,600,800 | 1,433,250 | 135,147,210 |

දෙහිවල සත්වෝද්‍යානයට පැමිණි විදේශීය නරඹන්නන්ගේ සංඛ්‍යාව ඉකුත් වර්ෂය හා සසඳන විට 5,932 කින් හෙවත් සියයට 28 කින් වැඩිවී තිබූ අතර, එමගින් ලද ආදායම රු. 9,413,500 කින් හෙවත් සියයට 37.5 කින් වැඩිවී තිබුණි. එසේම දේශීය නරඹන්නන්ගේ සංඛ්‍යාව හා ආදායම පිළිවෙලින් 17,260 කින් සහ රු. 2,040,090 කින් වැඩිවී තිබුණි.

(ආ) පින්නවල අලි අනාථාගාරය

| | 2013 | | 2012 | |
|---|---|---|---|---|
| | පැමිණි නරඹන්නන් සංඛ්‍යාව | නරඹන්නන්ගෙන් ලද ආදායම | පැමිණි නරඹන්නන් සංඛ්‍යාව | නරඹන්නන්ගෙන් ලද ආදායම |
| | | රු. | | රු. |
| දේශීය | 437,628 | 33,115,310 | 497,157 | 36,083,510 |
| විදේශීය | 278,740 | 516,401,750 | 266,297 | 455,554,750 |
| එකතුව | 716,368 | 549,517,060 | 763,454 | 491,638,260 |

පින්නවල අලි අනාථාගාරයට පැමිණි විදේශීය නරඹන්නන්ගේ සංඛ්‍යාව ඉකුත් වර්ෂයට සාපේක්ෂව 12,443 කින් හෙවත් සියයට 4.7 කින් වැඩිවී තිබූ අතර, එමගින් ලද ආදායම රු.60,847,000 කින් හෙවත් සියයට 13.3 කින් වැඩිවී තිබුණි. නමුත් සමාලෝචිත වර්ෂයේදී දේශීය නරඹන්නන්ගේ සංඛ්‍යාව 59,529 කින් හෙවත් සියයට 12 කින් අඩුවී තිබුණි. ඒ අනුව දේශීය නරඹන්නන්ගෙන් ලද ආදායම රු. 2,968,200 ක් අඩුවී තිබුණි.

(ඇ) විදේශිකයන්ගේ පහසුව සඳහා වෙනම ප්‍රවේශ පත්‍ර කවුළුවක් වෙන්කර නොතිබුණ අතර, ඉංග්‍රීසි ඇතුළු වෙනත් භාෂාවල ප්‍රවීනත්වයක් ඇති කාර්යමණ්ඩලයක් ප්‍රවේශ පත් කවුළුවේ සේවය සඳහා යෙදවිය යුතු වුවද, එසේ සිදුකර නොතිබුණි. තවද, සංචාරකයින් සඳහා නැරඹුම් මධ්‍යස්ථාන ඉදිකර අවශ්‍ය පහසුකම් සැලසීමට කටයුතු කර නොතිබුණි.

## 4.2 මෙහෙයුම් ආකාර්යක්ෂමතා

දෙහිවල සත්වෝද්‍යානයේ අලෙවි සැල් 03 ක් මාසික බදු කුළිය රු. 30,000 ක්, රු. 20,000 ක් හා රු. 15,000 ක් වශයෙන් ආයතන තුනකට වසරක කාලයක් සඳහා බදු දීමේදී අදාළ ගිවිසුම්වල වැට් බදු පිළිබඳව සඳහන් කර නොතිබූ නමුත් සමාලෝචිත වර්ෂයේදී රු.62,678 ක් එකතු කළ අගය මත බදු වශයෙන් අරමුදලෙන් ගෙවා තිබුණි.

## 4.3 කළමණාකරණ අකාර්යක්ෂමතා

සමාලෝචිත වර්ෂයේදී ලබාදී තිබුණු අලි ඇතුන් තිදෙනෙකු ඇතුළු රු. 89,015,000 ක් වටිනා අලි ඇතුන් 15 දෙනෙකු වර්ෂය අවසාන වනවිට බාහිර පාර්ශවයන්ට රැකබලා ගැනීම සඳහා ලබාදී තිබූ අතර, එම සතුන්ගේ පැවැත්ම තහවුරු කරගෙන නොතිබුණි.

## 4.4 ආර්ථික නොවූ ගණුදෙනු

පින්නවල අලි අනාථාගාරයට 2013/2014 වර්ෂය සඳහා පලතුරු සැපයීමේ ලංසුව රු.7,615,725 කට පිරිනැමීමේදී පහත අඩුපාඩු නිරීක්ෂණය විය.

(i) පළමුවර පුවත්පත් දැන්වීමක් පලකර ඒ අනුව ලැබී තිබුණු ලංසු දෙකක් පිළිගත හැකි හේතු නොමැතිව ප්‍රතික්ෂේප කර නැවත පුවත්පත් දැන්වීමක් පලකර ලංසු කැඳවා තිබුණි. ඒ අනුව තෝරාගත් ලංසුකරු පෙර ලංසු ඉදිරිපත් කර තිබුණු ලංසුකරුවකුම වූ අතර, ඔහු විසින්ම දෙවන අවස්ථාවේ ඇඹුල් කෙසෙල්, පැණි කොමඩු හා අන්නාසි යන පළතුරු සඳහා සෑම කිලෝග්‍රෑම් එකකටම රු.10 බැගින් වැඩිකර රු.95, රු.126 හා රු.175 ක් වශයෙන් ලංසු ඉදිරිපත් කර තිබුණි. පිළිගත හැකි හේතුවකින් තොරව පළමු ලංසුව අවලංගු කිරීම හේතුවෙන් තාක්ෂණික ඇගයීම් කමිටුව හා ප්‍රසම්පාදන කමිටුව අරමුදල වෙත රු.690,618 ක දෘෂ්‍ය පාඩුවක් සිදුකර තිබුණි.

(ii) 2012/2013 වර්ෂය සඳහා පළතුරු සැපයීමේ ටෙන්ඩරයද මෙම සැපයුම්කරු විසින් ලබාගෙන තිබූ අතර, ඔහු විසින් ඉහත පළතුරු කිලෝග්‍රෑම් එකක් 2013/2014 වර්ෂයට වඩා පිළිවෙලින් රු.30, රු.61 ක් හා රු.65 කින් මිල අඩුවෙන් සපයා තිබුණි.

(iii) මෙම මිල ගණන් දෙහිවල සත්වෝද්‍යානයට එම පළතුරු සැපයුම් මිලට වඩා පිළිවෙලින් රු.45.50 ක් රු.67 ක් හා රු.105 ක් වැඩි වූ මිල ගණන් විය. ඒ අනුව අලි අනාථාගාරය සඳහා පළතුරු සැපයුම් මිල දෙහිවල සැපයුම් මිලට වඩා සියයට 92 ක්, සියයට 113 ක් හා සියයට 150 ක ඉහළ මට්ටමක පැවතුණි.

(iv) 2013 ජනවාරි සිට 2013 දෙසැම්බර් 27 දින දක්වා කාලය තුළ ගිවිසුම්ගත ප්‍රමාණයන්ට වඩා පලතුරු කිලෝ ග්‍රෑම් 19,575 ක් සපයා තිබූ අතර ඒ සඳහා රු. 1,788,953 ක් වැඩිපුර ගෙවීම් කර තිබුණි.

## 4.5 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) දෙහිවල සත්වෝද්‍යාන පරිශ්‍රයේ ගල්වල අසල මායිම් තාප්පයේ කඩා වැටුණු කොටස් අළුත්වැඩියාව සඳහා රු. 6,023,174 ක ඇස්තමේන්තුවකට රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව වෙත ලබා දී තිබූ අතර රු.1,204,634 ක වැඩ පූර්ව අත්තිකාරම් ද ගෙවා තිබූ නමුත්, අමාත්‍ය මණ්ඩල තීරණයකට අනුව රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව සියළු ඉදිකිරීම් වලින් ඉවත්කර තිබූ බැවින් 2014 ජූලි 31 වන විටත් මෙම ඉදිකිරීම අවසන් කර නොතිබුණි.

එම මුදල් ඉදිරියේදී ගෙවීමට ඇති වෙනත් බිල්පත්වලින් හිලව් කිරීමට කටයුතු යොදා ඇති බව අධ්‍යක්ෂවරයා විසින් දන්වා තිබුණි.

(ආ) 2013 වර්ෂය තුළදී රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව විසින් අතරමඟ නවතා දමා තිබුණු නිදහස් අලි අරණ ඉදිකිරීමට අදාලව ගෙවා තිබූ කොන්ත්‍රාත් වටිනාකම රු. 10,264,754 ක් වූ අතර, එහි වැඩකටයුතු 2014 සැප්තැම්බර් 30 දක්වාම අවසන් කර නොතිබුණි.

## 4.6 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

දෙහිවල සත්වෝද්‍යානයේ තුළ පවත්වාගෙන යන සුහසාධක අලෙවි සැලේ සමාලෝචිත වර්ෂයේ කුළී ආදායම වූ රු.4,882,250 ක මුදල අරමුදලේ ආදායමට බැර නොකර එය දෙපාර්තමේන්තුවේ සේවක සුහසාධක සංගමයට ලබාදී තිබීම හේතුවෙන් අරමුදලේ ආදායම එම ප්‍රමාණයෙන් අඩුවෙන් දැක්වුණි. තවද, අලෙවිසැලේ විදුලි වියදම වෙනුවෙන් මාසිකව රු.20,000 ක් බැගින් රු.240,000 ක් සමාලෝචිත වර්ෂය සඳහා දෙපාර්තමේන්තුව විසින් ගෙවා තිබුණි.

## 05. ගිණුම් කටයුතු භාවය හා යහපාලනය

### 5.1 ක්‍රියාකාරී සැලැස්ම

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2013 වර්ෂය සඳහා සකස් කර තිබූ ක්‍රියාකාරී සැලැස්මෙහි ප්‍රධාන ව්‍යාපෘති යටතේ වන එක් එක් වැඩසටහන් වෙනුවෙන් ප්‍රවර්තන වර්ෂයට අදාල මුදල් ප්‍රතිපාදනය දක්වා නොතිබුණි.

(ආ) ආයතනය කාර්තුමය වශයෙන් කාර්යසාධන වාර්තා සකස් කර තිබුණද, එමඟින් ඇස්තමේන්තුගත ප්‍රතිපාදනය හා සත්‍ය වියදම් සංසන්දනය කිරීම සඳහා ප්‍රමාණවත් තොරතුරු ඉදිරිපත් කර නොතිබුණි.

(ඇ) එක් එක් කාර්යයන් සඳහා අපේක්ෂිත මුළු වියදම, වර්ෂය තුළ ඇස්තමේන්තුගත වියදම, වර්ෂය තුළදී දැරූ සත්‍ය වියදම යන කරුණු ඇතුළත් කර නොතිබුණි.

(ඈ) ප්‍රධාන කාර්යයන් අනුව පමණක් වර්ෂයේ මුදල් වෙන් කිරීම දක්වා තිබුණු අතර, උප කාර්යයන්හි වියදම එහි මූල්‍ය කාර්යසාධනය , කාර්යසාධන වාර්තා තුළින් ඉදිරිපත් කර නොතිබුණි.

(ඉ) එක් එක් කාර්යයන් සඳහා මුදල් වැය කිරීම සත්වෝද්‍යාන සංවර්ධන අරමුදලින්ද, සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුවෙන් ද යන්න කාර්යසාධන වාර්තා තුළින් හඳුනා ගැනීමට නොහැකි විය.

### 5.2 අභ්‍යන්තර විගණනය

2013 වර්ෂය සඳහා සත්වෝද්‍යාන සංවර්ධන අරමුදල විසින් අභ්‍යන්තර විගණනයක් ක්‍රියාත්මක කර නොතිබුණි.

### 5.3 විගණන කමිටු

2013 වර්ෂය සඳහා විගණන කමිටු රැස්වීම් පවත්වා නොතිබුණි.

### 5.4 අයවැය ලේඛනමය පාලනය

හම්බන්තොට සෆාරි උද්‍යානය, පින්නවල නව සත්වෝද්‍යානය හා පින්නවල අලි අනාථාගාරයේ ඉදිකිරීම් වෙනුවෙන් සංවර්ධන අරමුදල යටතේ ප්‍රාග්ධන ඇස්තමේන්තු මඟින් රු. 442,000,000 ක මුදලක් වෙන්කර තිබූ අතර, සත්වෝද්‍යාන දෙපාර්තමේන්තු වැය ශීර්ෂ මඟින්ද මෙම ඉදිකිරීම් සඳහා රු. 284,000,000 ක මුදලක් වෙන්කර තිබුණි. නමුත් ව්‍යාපෘතිය යටතේ අදාල කාර්යයන් වෙන්

වෙන්ව හඳුනාගෙන මුදල් වෙන්කර නොතිබුණි. මේ නිසා ප්‍රාග්ධන වියදම්වලට අදාල ඉදිකිරීම්වල අගය නිවැරදිව හඳුනාගත නොහැකිවී තිබුණි.

## 5.5 නොවිසඳුන විගණන ඡේද

-----------------------------

2011 හා 2012 වර්ෂ අවසානයේ සමරු භාණ්ඩ තොග අතර පැවති වෙනස වශයෙන් දක්වා තිබුණු රු. 3,049,123 ක් 2012 වර්ෂයේදී සමුච්චිත අරමුදලින් ලියාහැර තිබුණි. මේ පිළිබඳව විගණනය මඟින් පෙන්වා දීමෙන් පසු, නිවැරදි නොවන එම කපා හැරීම 2013 මූල්‍ය ප්‍රකාශ මඟින් නිවැරදි කරන බව දක්වා තිබුණද, එබඳු නිවැරදි කිරීමක් 2013 වර්ෂයේදී සිදුකර නොතිබුණි. එහෙයින් සමුච්චිත අරමුදල් ශේෂය එම ප්‍රමාණයෙන් අඩුවෙන් දැක්වුණි.

## 06. පද්ධති හා පාලනයන්

-----------------------

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින් වර අධ්‍යක්ෂවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් සම්බන්ධයෙන් විශේෂ අවධානය යොමු කළයුතු වේ.

(අ) අයවැය පාලනය
(ආ) ස්ථාවර වත්කම් ගිණුම්කරණය
(ඇ) සත්ව ආහාර සැපයීමේ ක්‍රියාවලිය
(ඈ) ප්‍රවේශ පත්‍ර නිකුත් කිරීම හා ආදායම් එකතු කිරීම
(ඉ) අභ්‍යන්තර විගණනය
(ඊ) තොග පාලනය
(උ) වාහන පාලනය
(ඌ) වියදම් පාලනය